# ලාංකීය බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා ප්‍රභූවරුන්ගේ දායකත්වය සංස්කෘත ශිලා ලිපි කිහිපයක් ඇසුරින්

එන්.ඩී.එන්.එස්.චන්ද්‍රසිරි[25]

දිවයිනේ නන් දෙසින් ලැබෙන සංස්කෘත භාෂාවෙන් රචිත ශිලා ලිපි සංස්කෘත ශිලා ලිපි වශයෙන් හැඳින්වේ.විවිධ අරමුණු ප්‍රමුඛ කොට ගනිමින් ලියූ මෙම සෙල්ලිපි තුළින් ප්‍රභූවරු විසින් බුදු සසුනේ චිරස්ථිතිය සඳහා ක්‍රියා කළ ආකාරය කෙසේවී ද යන්න පැහැදිලි වේ. අතීත පාලකයින් බුදු දහමේ අනන්‍යතාව සුරැකි බවත් එහි චිරස්ථිතිය තහවුරු කළ බවටත් සංස්කෘත සෙල්ලිපි සාක්ෂි දරයි. සංස්කෘත ශිලා ලිපි අතර ජේතවනාරාම ශිලා ලිපියට වැදගත් ස්ථානයක් හිමි වන අතර එහිදී පනවා ඇති නියමයන් අනුව පිළිසරණක් නොමැතිව සිටින තම වයෝවෘද්ධ මව්පියන් රැක බලා ගැනීමේ අරමුණින් භික්ෂූන් උපැවිදි වීම පාලනය කිරීමට එම ලිපිය පිහිට වූ රජු කටයුතු කර ඇත. එමනිසා එමඟින් ශාසනයේ පාරිශුද්ධත්වය මෙන්ම ශාසන චිරස්ථිතිය තහවුරු කොට ඇත. රුවන්වැලි සෑ සංස්කෘත පුවරු ලිපියට අනුව වෛරී කෛරාටික පුද්ගලයින් පැවිදි නොකරන ලෙස උපාධ්‍යාය තෙරුන්ගෙන් ඉල්ලා සිටි අතරම රජු මෙයට අනුබල දීමක් වශයෙන් දුසිල් මහණුන්ටද, සසුනේ කලකිරුනවුන්ටද, සිවුරුහළවුන්ටද ජීවත් වීම සඳහා රන් රිදී ආහාර පාන හා රැකියා ලබා දීම තුළින් ඔවුන් තෘප්තිමත් කළ අතර එහි ප්‍රධාන අපේක්ෂාව වී ඇත්තේ ශාසන චිරස්ථිතියයි.සංස්කෘත ශිලා ලිපි අතර සබරගමුවේ ලක්ෂ්මණ මහා සමන් දේවාලයේ සංස්කෘත ශිලා ලේඛනයද වැදගත් වේ. එ මඟින් දේවාලයේ හා බුද්ධ ප්‍රතිමා ගෘහයේ නව කර්මාන්ත කරවා පුද පූජා පවත්වා එය රැක ගැනීමට අනාගත පාලකයින්ගෙන් ඉල්ලීමක් කරමින් පිහිටුවා ඇත.එසේම ජේතවනාරාම සංස්කෘත ශිලා ලිපියට අනුව ආරාමයන්හි අය වැය මාසික වාර්තා සමග වර්ෂාවසානයේ ලේකම් පොතට ඇතුළත් කර වාර්ෂික අයවැය වාර්තාවක් ද සංඝ සභාවට ඉදිරිපත් කිරීම සම්ප්‍රදාය වූවා සේම එම සම්ප්‍රදාය කඩ කරන්නන් හට දඩුවම් නියම කිරීම ද සිදු කර ඇත.දෙවැනි පෑතිස් රාජ්‍ය සමයේ සිටම භික්ෂූන් හා රජවරු අතර රාජ්‍ය පාලන කටයුතු වලදී නිරතුරුව භික්ෂූන්ගේ අනුශාසකත්වය හා මාර්ගෝපදේශකත්වය ඔවුන්ට හිමි විය.එහි ලා ප්‍රතිඋපකාර වශයෙන් පාලකයින් විසින් විහාරයන්හි සෑම කටයුත්තක් උදෙසාම පත් කරන ලද නිලධාරීන් පිරිසක්ද සිටි බවට මෙම සංස්කෘත ශිලා ලිපි තුළින් කරුණු අනාවරණය වේ. මේ සෑම ක්‍රියාවක්ම සංඝයාගේ සුබ විහරණය හා ශාසන චිරස්ථිතිය උදෙසා විය.උක්ත කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේදී ලක්දිව බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය උදෙසා ප්‍රභූවරුන් නිස්සරණාධ්‍යාශයෙන් ක්‍රියා කළ බව මෙම සංස්කෘත සෙල්ලිපියෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ ශිලා ලිපි, භික්ෂුන්, රජවරු

[25] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, shyamali8nd@gmail.com.